සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) බහුපක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවලට නිදසුන් සපයන පිළිතුර වනුයේ,

(1) මහා බ්‍රිතාන්‍ය හා ඇමරිකා එක්සත් ජනපදය ය.
(2) ශ්‍රී ලංකාව හා ඉන්දියාව ය.
(3) චීනය හා කියුබාව ය.
(4) උතුරු කොරියාව හා ජපානය ය.

(02) දැනට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පරමාධිපත්‍ය පවරා ඇත්තේ මහජනතාව වෙත ය. ජනතාව තම පරමාධිපති බලය ක්‍රියාවට නංවන මාර්ග වනුයේ,

(1) ඡන්ද බලය, මූලික අයිතිවාසිකම්, පාලන බලතලයි.
(2) ජනවර්ග, රැකියාව, ආදායමයි.
(3) පක්ෂක්‍රමය, මහජන ලැදියාව, ජනවර්ගයයි.
(4) ජනමතය, පක්ෂ ප්‍රතිපත්ති, ඡන්ද අපේක්ෂත්වයයි.

(03) A - සිහි විකල් වූවකු වීම
B - ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
C - ඡන්ද ලැයිස්තුවේ නම ඇතුළත්ව තිබීම
D - අවුරුදු හතකට වඩා බන්ධනාගාර ගත වූවකු වීම

ඉහත දක්වා ඇති ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන වගන්ති වල ඡන්ද දායකු වීමට අවශ්‍ය නුසුදුසුකම් සඳහන් වන අක්ෂර දෙක වනුයේ,

(1) A හා C ය. (2) B හා D ය.
(3) A හා D ය. (4) A හා B ය.

(04) රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉටු කරනු ලබන්නේ,

(1) විධායකය යි. (2) ව්‍යවස්ථාදායකය යි.
(3) ජන මාධ්‍යය යි. (4) අධිකරණය යි.

(05) "ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවා ගත් සංවිධානය රාජ්‍යය වේ" යනුවෙන් නිර්වචනය සැපයුයේ,

(1) මහාචාර්ය ගානර් ය. (2) ඇරිස්ටෝටල් ය.

(3) ජී.ඩී.එම්. කෝල් ය. (4) මහාචාර්ය ඒ.වී. ඩයිසිය ය.

(06) ප්‍රාදේශීය ආණ්ඩු නැතහොත් ප්‍රාන්ත 'කැන්ටන්' නමින් හඳුන්වන රට වනුයේ,

(1) ස්විට්සර්ලන්තය යි. (2) මහා බ්‍රිතාන්‍යය යි.

(3) ප්‍රංශය යි. (4) ශ්‍රී ලංකාව යි.

(07) ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කිරීමට බලපානු ලැබූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වන්නේ,

(1) 4 ය. (2) 6 ය. (3) 9 ය. (4) 13 ය.

(08) මධ්‍යම ආණ්ඩු විසින් ක්‍රියාවට නංවනු ලබන ජාතික වශයෙන් වැදගත් අන්තර්ගත සංවෘත ලැයිස්තුවට අයත් විෂය කරුණු ගණන,

(1) 17 කි (2) 36 කි (3) 37 කි (4) 40 කි

(09) ආර්ථික නොවන භාණ්ඩයක් ඇතැම් විට ආර්ථික භාණ්ඩයක් වන අවස්ථාවකට උදාහරණයකි,

(1) ආහාර (2) ඇඳුම් (3) ජලය. (4) ඖෂධ.

(10) ධනවාදී අර්ථ ක්‍රම පවතින රටවලට නිදසුන් ලෙස දැක්විය හැකි රටවල් තුනක නම් පහත දැක්වේ. නිවැරදි වරණය තෝරන්න.

(1) ඕස්ට්‍රේලියාව, උතුරු කොරියාව, කියුබාව

(2) ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ජපානය

(3) ශ්‍රී ලංකාව, රුසියාව, චීනය

(4) පෝලන්තය, සිංගප්පූරුව, ඉන්දියාව

(11) විවෘත ආර්ථික ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ වර්ෂය කුමක් ද?.

(1) 1963 (2) 1970 (3) 1977 (4) 1980

(12) සංවර්ධනය කරා යන ගමනේ දී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම හඳුන්වන්නේ,

(1) තිරසාර සංවර්ධනය නමින් ය. (2) සමාජ සංවර්ධනය නමින් ය.

(3) පුද්ගල සංවර්ධනය නමින් ය. (4) ආර්ථික සංවර්ධනය නමින් ය.

(13) A - තාක්ෂණය සමග ලෝකය සමීප වීම.

B - වැඩ ලෝකය පුළුල් වීම.

C - ලෝක ආර්ථිකය එක ඒකකයක් බවට පත් වීම.

D - ලෝකයේ ඕනෑම රටක ජීවත් වීමට හැකි වීම

ඉහත වගන්ති අතුරින් ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ඇතුළත් වගන්ති වනුයේ,

(1) A හා B ය. (2) B හා D ය.

(3) A හා C ය. (4) C හා D ය.

(14) ගෝලීයකරණයට මුහුණදීමට විවිධ රටවල් එකතු වී පිහිටුවා ගෙන ඇති සංවිධාන 'A'තීරුවෙන් ද ඒවායේ අරමුණු 'B' තීරුවෙන් ද දැක්වේ. A හා B තීරු ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| (1) යුරෝපා සංගමය. | A. කලාපීය වෙළෙඳාම පුළුල් කිරීම |
| (2) උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම. | B. මූල්‍ය ගණුදෙනු වඩා ක්‍රමවත් කිරීම |
| (3) දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම. | C. කලාපීය සහයෝගීතාව ඇති කිරීම |
| (4) බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගිතා සංගමය | D.විවෘත ආර්ථික ප්‍රතිපත්ති ලෝකයට හඳුන්වා දීම. |

(1) A,C,B,D (2) B,A,D,C
(3) B,E,A,C (4) C,B,D,A

(15) ගැටුම් පිළිබඳව අධ්‍යයනය සඳහා යොදා ගනු ලබන ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ,
(1) ජොහාන් ගැල්ටුන් ය. (2) විල්සන් විල්හෙව් ය.
(3) ජෝන් ස්මිත් ය. (4) මාර්ක් හැමිල්ටන් ය.

(16) වාර්ගිකත්වය, දේශපාලනය, සමාජ ආර්ථික තත්ත්වය, ආගමික මතවාද යන කරුණු
(1) ගැටුම ඇති වීමට බලපාන මූලික හේතුන් ය. (2) ගැටුම ඇතිවන මූලයන් ය.
(3) ගැටුම ඇති වන පාර්ශ්වයන්ය ය. (4) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයන් ය.

(17) වෘත්තිය ක්ෂේත්‍රය තුළ සේව්‍ය සේවක දෙපාර්ශවය වෘත්තීය ගැටලු ඇති වූ අවස්ථාවල එය විසදා ගැනීමට යොදා ගනු ලබන ක්‍රමවේදය කුමක් ද?
(1) සාකච්ඡා ක්‍රමය . (2) සහමත්‍රණය හා කේවල් කිරීම.
(3) මැදිහත් කරණය. (4) සමථකරණය.

(18) "නීතිය යනු රාජ්‍යය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ පද්ධතිය"යනුවෙන් නිර්වචනය කරනු ලැබුවේ,
(1) ජෝන් ඔස්ටින් ය. (2) මයිකල් ඇල්බි ය.
(3) හැරන් ජෝන්ස් ය. (4) ටී.එච්.ග්‍රීන් ය.

(19) යුක්තිය, සාමය හා සුරක්ෂිතතාවය යන්න,
(1) නීතියේ මූලාශ්‍රන් ය.
(2) නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක වන සමාජයක ලක්ෂණයන් ය.
(3) බේරුම්කරණයට අයත් සංකල්පයන් ය.
(4) යුක්තිය ඇති කිරීමට පිළිබඳ වැදගත් කරුණු ය.

(20) ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචනා අධිකරණ බලය සහිත උපරිමාධිකරණය වන්නේ,
(1) අභියාචනාධිකරණය යි. (2) ශ්‍රේෂ්ඨාධිකරණය යි.
(3) මහාධිකරණය යි. (4) මහේස්ත්‍රාත් අධිකරණය යි.

(21) ද්‍රවිඩ ජනතාවගේ උරුම අයිතිවාසිකම් දේපළ පිළිබඳ කරුණු පාලනය වන නීතිය හඳුන්වන නම කුමක්ද?,

(1) මුස්ලිම් නීතිය. (2) සිවිල් නීතිය.
(3) උඩරට නීති ය. (4) තේසවලාමේ නීතිය

(22) බස්නාහිර පළාතට අයත් ප්‍රාදේශීය සභා ගණන,

(1) 20කි. (2) 22කි. (3) 25කි. (4) 27කි.

(23) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඉහළ ම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව එංගලන්තයේ රාජාධිකරණය වෙත අභියාචනා කළ හැකි බලය අහෝසි කරනු ලැබුවේ,

(1) 1833 කෝල්බෲක් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ය.
(2) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ය.
(3) 1972 ඇති කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ය.
(4) 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ය.

(24) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයට අනුව ශ්‍රී ලංකාව බෙදා ඇති පළාත් ගණන,

(1) 7 කි. (2) 9 කි.
(3) 10 කි. (4) 12 කි.

(25) A - ජනතාව විසින් ඡන්ද බලයෙන් තේරූ මන්ත්‍රීන්වරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව මගින් ක්‍රියාත්මක කරයි.

B - ජනතාව විසින් ඡන්ද බලයෙන් තෝරා පත් කර ගන්නා ජනාධිපති හා ජනාධිපති විසින් තෝරා ගන්නා කැබිනට් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරයි.

C - ජනතාවගේ අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රමුඛ උසාවි පද්ධතිය තුළින් ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහත A,B,C යන ඉංග්‍රීසි අක්ෂර වලට අයත් වගන්ති වලින් දක්වා ඇත්තේ,

(1) ජනතාවගේ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලයයි.
(2) ජනතාවගේ ව්‍යවස්ථාදායක, අධිකරණ, විධායක බලයයි.
(3) ජනතාවගේ විධායක, ව්‍යවස්ථාදායක, අධිකරණ බලයයි.
(4) ජනතාවගේ අධිකරණ, ව්‍යවස්ථාදායක, විධායක බලයයි.

(26) වයස අවුරුදු 21 ඉක්ම වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ සියලු දෙනාටම ඡන්ද බලය ප්‍රදානය කරන ලද්දේ,

(1) කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ය.
(2) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ය.
(3) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ය.
(4) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ය.

(27) පහත සඳහන් 'අ' තීරුවේ එන පරිපාලන කොට්ඨාසය සමඟ 'ආ' තීරුවේ එන පරිපාලන තනතුරු හා ගළපා නිවැරදි පිළිතුර තෝරන්න,

| ' අ ' තීරුව | ' ආ ' තීරුව |
|---|---|
| (1) ග්‍රාම නිලධාරි කොට්ඨාසය. | A. ප්‍රාදේශීය ලේකම් |
| (2) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. | B. දිස්ත්‍රික් ලේකම් |
| (3) පරිපාලන දිස්ත්‍රික්කය | C. ග්‍රාම නිලධාරි |
| | D. අමාත්‍යංශ ලේකම් |

(1) A, B, D ය. (2) C, A, B ය.
(3) D, A, B ය. (4) A, B, C ය.

(28) 'අ' තීරුවෙන් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අධිකරණ, ආයතන හතරක් ද 'ආ' තීරුවෙන් එම ආයතන සතු අධිකරණ බලයන් ද දැක්වේ.'අ' හා 'ආ' තීරු ගළපා නිවැරදි වරණය තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| (1) ශ්‍රේෂ්ඨාධිකරණය. | A. විවිධ ආඥා නිකුත් කිරීමේ බලය |
| (2) අභියාචනාධිකරණය. | B. විවාහ සම්බන්ධ නඩු |
| (3) පළාත්බද මහාධිකරණය. | C. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේ බලය |
| (4) දිසා අධිකරණය. | D. කම්කරු විනිශ්චය සභා තීරණ පිළිබඳ අභියාචනා විසඳීම |
| | E. මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි |

(1) C, A, D, B ය. (2) A, B, C, D ය.
(3) B, A, C, E ය. (4) D, B, C, A ය.

(29) ශ්‍රී ලංකාවේ ජ්‍යෝෂ්ඨ පුරවැසියකු ලෙස සැලකෙන කඩඉම් වයස,
(1) අවුරුදු 50 - 52 අතර පවතී.
(2) අවුරුදු 50 - 55 අතර පවතී.
(3) අවුරුදු 50 - 60 අතර පවතී.
(4) අවුරුදු 65 වැඩි.

(30) දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලබන්නේ,
(1) මධ්‍යම ආණ්ඩුව යන නමිනි. (2) පාර්ලිමේන්තුව යන නමිනි.
(3) කවුන්සලය යන නමිනි. (4) රාජ්‍ය මන්ත්‍රණ සභාව යන නමිනි.

(31) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් ප්‍රාදේශීය සභා පිහිටුවා ඇත. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා ගණන,
(1) 200 කි. (2) 260 කි. (3) 271 කි. (4) 280 කි.

(32) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා තුනක් යටතේ දක්වා ඇත. ජල සම්පාදනය යන කාර්යය අයත් වනුයේ,
(1) පොදු මංමාවත් තේමාවට ය.
(2) පොදු උපයෝගීතා සේවා තේමාවට ය.
(3) මහජන සෞඛ්‍ය තේමාවට ය.
(4) කෘෂිකර්මය හා ගොවිජන සේවා තේමාවට ය.

(33) මානව හිමිකම් භුක්ති විඳීමේදී කාන්තාවන්ට එරෙහිව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් සමාජය තුළින් තුරන් කිරීමේ අරමුණින් (CEDAW) සම්මුතිය සම්මත කර ගනු ලැබුවේ,
(1) 1976 මැයි 16 වන දිනය. (2) 1979 දෙසැම්බර් 18 වන දිනය.
(3) 1980 දෙසැම්බර් 01 වන දිනය. (4) 1981 ජනවාරි 14 වන දිනය.

(34) ● ජීවත්වීම සඳහා අයිතිය සෑම ළමයෙකුටම ඇති බව පාර්ශවකරුවන් වන රාජ්‍යයන් පිළිගනියි.

● වයස අවු : 18 අඩු සෑම මනුෂ්‍යයකුම ළමයෙකු ලෙස සැලකේ

ඉහත ප්‍රකාශනයන් සඳහන් වන්නේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ

(1) 6 සහ 1 වන වගන්ති වල ය. (2) 3 සහ 1 වගන්ති වල ය.

(3) 3 සහ 6 වගන්ති වල ය. (4) 6 සහ 3 වගන්ති වල ය.

(35) වැඩ කරන ජනතාව වෙනුවෙන් සමාජ සාධාරණත්වය ඉටු කිරීම අරමුණු කරගෙන අන්තර් ජාතික කම්කරු සංවිධානය බිහි වූයේ,

(1) වර්ෂ 1909 දී ය. (2) වර්ෂ 1919 දී ය.

(3) වර්ෂ 1929 දී ය. (4) වර්ෂ 1939 දී ය.

(36) වායු දූෂණයේ ස්වභාවික ක්‍රමයකි .

(1) ප්‍රවාහන කටයුතු (2) කැලිකසළ

(3) ගුවන් යානා භාවිතය (4) ගිනි කඳු පිපිරීම

(37) සංවර්ධිත රටකට උදාහරණයකි,

(1) බංගලාදේශය (2) ඉන්දියාව

(3) සියොරාලියෝන් (4) ඇමරිකා එක්සත් ජනපදය

(38) සංවර්ධනය මැනීමේ නූතන මිණුමක් නොවන්නේ,

(1) දළ ජාතික නිෂ්පාදිතය යි. (2) භෞතික ජීවන තත්ව දර්ශකය යි.

. (3) මානව සංවර්ධන දර්ශකය යි. (4) පරිගණක සාක්ෂරතාවය යි.

(39) සාර්ක් සංවිධානයට අයත් රටවල් සංඛ්‍යාව,

(1) පහකි. (2) හයකි. (3) අටකි. (4) නවයකි.

(40) එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන කිහිපයක් හා ඒවායේ අරමුණු පහත දැක්වේ.'අ' හා 'ආ' තීරු ගැළපු විට නිවැරදි පිළිතුර කුමක් ද?

| 'අ' | 'ආ' |
|---|---|
| (1) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්කම හා සංස්කෘතික සංවිධානය | A. සංවර්ධන වන රටවල ආර්ථික හා සමාජ සංවර්ධනය කඩිනම් කිරීමට සහාය වීම. |
| (2) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | B. අන්තර් ජාතික බුද්ධිය තුළින් සාමය ඇති කිරීම. |
| (3) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන. | C. ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා තහවුරු කිරීම. |
| 4) ලෝක ආහාර වැඩ සටහන. | D.සරණාගතයින්ට මානුෂවාදී සහන සැලසීම. |
| | E. සාගින්න හා දරිද්‍රතාව පිටු දැකීම. |

(1) A,C,B,E ය. (2) B,C,A,E ය.

(3) A,B,C,D ය. (4) B,A,D,E ය.

(ලකුණු 01 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේල් மாகாணக் கல்வித் திணைக்களம் Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන සැපයූ චින්තකයන් දෙදෙනකු නම් කරන්න.

(ii) මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිසන් සභාව මගින් ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන නිර්ණායක දෙක ලියන්න.

(iii) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(iv) සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවලට නිදසුන් දෙකක් ලියන්න.

(v) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුනෙන් දෙකක් නම් කරන්න.

(vi) මුස්ලිම් නීතියේ මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන්වරයාගේ ප්‍රධාන කාර්යයන් දෙක සඳහන් කරන්න.

(viii) ඒකීය රාජ්‍යයන්ට උදාහරණ දෙකක් ලියන්න.

(ix) මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(x) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02 x 10 = 20)

(02) "වර්තමාන ලෝකයේ දක්නට ලැබෙන පාලන ක්‍රම අතුරින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට වැදගත් ස්ථානයක් හිමි වේ"

(i) අතීතයේ පටන් ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා යොදා ගත් ක්‍රමවේද දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ දැකිය හැකි එක් ස්වරූපයක් වේ. වර්මානයේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී මතු වන ගැටළු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක දක්නට ලැබෙන අංග ලක්ෂණ තුනක් නම් කරන්න.

(b) මින් එකක් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්මට දායක වන අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) "එකම සමාජයක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන් ජීවත් වන්නේ නම් එවැනි සමාජයක් බහු සංස්කෘතික සමාජයක් ලෙස සැලකේ"

(i) සංස්කෘතිය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

(ii) බහුසංස්කෘතික සමාජයක දැකිය හැකි මූලික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(b) බහුසංස්කෘතික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමට එම ගුණාංග කොතෙක් දුරට උපකාරීවේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(04) "වර්තමානයේ ක්‍රියාත්මක වන නව - ලිබරල්වාදී ආර්ථික ක්‍රමය වෙළෙඳපොළ ආර්ථිකය ලෙස හඳුන්වයි"

(i) වර්තමානයේ ක්‍රියාත්මක වන නව- ලිබරල්වාදී ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) වෙළෙඳපොළ අර්ථ ක්‍රමයන් ක්‍රියාත්මක වන රටවල ප්‍රධාන වශයෙන් දැකිය හැකි ස්වරූප තුන දක්වන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථක්‍රමයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(05) '' සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන විය යුතු අතර නීතියේ රැකවරණය සඳහා අයිතිවාසිකම් ලබති ''

(i) යුක්තිය ඇති කිරීම පිළිබඳව වැදගත් වන කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) නීතියට අදාළ ගුණාංග තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) (a) දේශීය නීතියේ කොටස් තුන සඳහන් කරන්න. (ලකුණු 03)

(b) මින් එක් නීතියකට අදාළ වන වැරදි උදාහරණ දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(06) "පරිසරය යනු ජීවී අජීවී සංරචක වල සංකලනයකි. මිනිසාගේ පැවැත්මට පරිසරය අත්‍යවශ්‍ය අංගයක් වන අතර මිනිසාට පරිසරයෙන් තොර පැවැත්මක් නොමැත."

(i) පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ස්වාභාවික පරිසරයට ඇතුළත් සංසිද්ධීන් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) පරිසරයෙන් ලැබෙන සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(b) ඉන් එක සේවාවක් පරිසරයේ යහපැවැත්මට බලපා ඇති අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(07) "රටවල් අතර පවත්නා අන්‍යෝන්‍ය සබැඳියාව ජාත්‍යන්තර සබඳතා යනුවෙන් හඳුන්වනු ලබයි"

(i) ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ආකාර දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහිලා බලපා ඇති සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(b) මින් එක් සාධකයක් තෝරා ගෙන එහි ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ලකුණු 02)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## පුරවැසි අධ්‍යාපනය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 3 | (21) | 4 | (31) | 3 |
| (2) | 1 | (12) | 1 | (22) | 4 | (32) | 2 |
| (3) | 3 | (13) | 2 | (23) | 3 | (33) | 2 |
| (4) | 4 | (14) | 3 | (24) | 2 | (34) | 1 |
| (5) | 2 | (15) | 1 | (25) | 1 | (35) | 2 |
| (6) | 1 | (16) | 2 | (26) | 3 | (36) | 4 |
| (7) | 4 | (17) | 2 | (27) | 2 | (37) | 4 |
| (8) | 1 | (18) | 4 | (28) | 1 | (38) | 1 |
| (9) | 3 | (19) | 2 | (29) | 3 | (39) | 3 |
| (10) | 2 | (20) | 2 | (30) | 2 | (40) | 2 |

(ලකුණු 1x40=40)

## පුරවැසි අධ්‍යාපනය II

(01) (i) ★ඒබ්‍රහම් ලින්කන් ★සීලර්

(ii) භූමිය හා ජනගහනය

(iii) ★ ඒකීය රාජ්‍ය ★ සන්ධීය රාජ්‍ය

(iv) ★ඇමෙරිකා එක්සත් ජනපදය ★ ස්විට්සර්ලන්තය ★ ඕස්ට්‍රේලියාව

(v) ★ මහනගර සභා ★ නගර සභා ★ ප්‍රාදේශීය සභා

(vi) ★ අල් - කුරානය ★ අල් - හදීස් / සුන්නාස් ★ ඉජ්මා හා කියාස් -

(vii) (i) සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැළැක්වීම

(ii) සියලු පරිපාලන අසාධාරණයන්ගෙන් පුරවැසියා ආරක්ෂා කිරීම

(viii) ★ මහා බ්‍රිතාන්‍ය ★ජපානය ★ ප්‍රංශය ★ පකිස්ථානය ★ බංගලාදේශය ★ නේපාලය

(ix) ★ ක්‍රි.ව 1215 - බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම.
★ ක්‍රි.ව 1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත.
★ ක්‍රි.ව 1776 - ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය.
★ ක්‍රි.ව 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය.
★ ක්‍රි.ව 1917 - රුසියානු විප්ලවය

(x) ★ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම.
★ ළමයින් සම්බන්ධ සෑම ක්‍රියාවලියකදීම හා ඔවුන් පිළිබඳ ගනු ලබන සෑම තීරණයකදීම "ළමයාගේ උපරිම යහපත" සැලසෙන පරිදි කටයුතු කිරීම.

★ ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම. (ලකුණු 2x10=20)

(02) (i) ★ රාජාණ්ඩු ක්‍රමය ★ රදළ ආණ්ඩු ක්‍රමය ★ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය
(දෙකක් දැක්වීමට ලකුණු 02යි)

(ii) ★ වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම.
★ වර්තමාන රාජ්‍ය අධික ජනගහනයෙන් සමන්විත වීම.
★ සියලු පුරවැසියන් එක් ස්ථානයක රැස් කිරීමේ අපහසුතාවය.
★ සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම. (ගැටළු තුනක් නම් කිරීමට ලකුණු 03)

(iii) (a) ★ සර්ව ජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයන් තෝරා ගැනීම.
★ තරඟකාරී පක්ෂ ක්‍රමය.
★ ඡන්ද කොට්ඨාස ක්‍රමය.
★ නිදහස් හා සාධාරණ මැතිවරණ.
(අංග ලක්ෂණ තුනක් දැක්වීමට ලකුණු 03යි)

(b) ★ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක පාලනය මහජන නියෝජිතයින් මගින් සිදු වීම.
★ 'ජනතා පරමාධිපත්‍ය' සර්ව ජන ඡන්ද බලය මගින් සැබෑ ලෙස ක්‍රියාවට නැංවේ.
★ ආණ්ඩුක්‍රම ආයතන හා පුරවැසි අයිතිවාසිකම් ආදිය පිළිබඳ පාලක, පාලිත යන දෙපක්ෂයම දැනුවත් වීම.
★ මතු සඳහන් කරුණු අනුව ආණ්ඩුක්‍රමයක ක්‍රමවත් බව හා ස්ථාවර බවක් ඇති වීම යනාදී වශයෙන් විස්තර කිරීමට.
(ලකුණු 02යි)

(03) (i) ★ ටී.බී. ටයිලර් ★ චාර්ල්ස් .ඒ.එල්වුඩ් ( දෙදෙනකු නම් කිරීම ලකුණු 02යි)

(ii) ★ විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරණ විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.
★ ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතීන්ට ආවේනික සිරිත් විරිත්, ආචාරධර්ම හා ඇගයීම් පද්ධතියක්, පැවැතීම.
★ එක ජන කොටසක වුව ද ප්‍රාදේශීයව විවිධත්වයක් දැකිය හැකි වීම.
(මූලික ලක්ෂණ තුනක් දැක්වීමට ලකුණු 03)

(iii) (a) ★ එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම, එකිනෙකාට ගරු කිරීම.
★ අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.
★ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
★ ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
★ සාමූහිකත්වය වර්ධනය කිරීම. (ගුණාංග තුනක් නම් කිරීමට ලකුණු 05 යි)

(b) ★ එකිනෙකා අවබෝධ කර ගැනීම, අන් අයට ගරු කිරීම, ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා ජීවත් වීමට පුද්ගලයන්ට හැකි වනුයේ යහපත් ගුණාංග තමා තුළ ඇති කර ගැනීමෙනි. (ලකුණු 02යි)

(04) (i) ⋆ රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලිකරණය කිරීම.
⋆ වෙළෙඳපොළ තත්ත්ව මත මිල තීරණය වීමට ඉඩ සැලසීම.
⋆ දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජනයන් දිරි ගැන්වීම.
⋆ පෞද්ගලික දේපළ අයිතියට ඉඩ දීම. (ලක්ෂණ දෙකක් නම් කිරීමට ලකුණු 02)

(ii) ⋆ ධනවාදී වෙළඳපොල ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන වෙළෙඳපොළ.
⋆ සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබීම.
⋆ පරිවර්තන ආර්ථිකය හෙවත් වෙළෙඳපොළ ආර්ථික ක්‍රම.
(ස්වරූප තුනක් දැක්වීමට ලකුණු 03 යි)

(iii) (a) ⋆ පෞද්ගලික අංශය දිරිගැන්වීම.
⋆ රජය ව්‍යවසාය කටයුතු වලින් ඈත් වීම.
⋆ රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලිකකරණය කිරීම.
⋆ විදේශ වෙළඳාම සම්බන්ද බාධා ලිහිල් කිරිම. (ලක්ෂණ තුනක් දැක්විමට ලකුණු 03යි)

(b) ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීය බලපෑම්
⋆ විදේශ ඍජු ආයෝජන යොදා ගත හැකි වීම.
⋆ දේශීය නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළ සමඟ සම්බන්ධ වීම.
⋆ කලාපීය සංවිධාන සමඟ සම්බන්ධ වීම නිසා ලබන ආර්ථික දේශපාලන වාසි.
(බලපෑම් විස්තර කිරීමට ලකුණු 02)

(05) (i) ⋆ තමාට ඉදිරිපත් ව ඇති චෝදනා පිළිබඳව දැන ගැනීමට ඇති අයිතිය.
⋆ තමා වෙනුවෙන් අධිකරණය ඉදිරියේ තමාම පෙනී සිටීමට හෝ නීතිඥයකු මගින් කරුණු කීමට ඇති අයිතිය.
⋆ සාධාරණ හා අපක්ෂපාති විනිශ්චයක් ලබා ගැනීමට ඇති අයිතිය.
(කරුණු දෙකක් සඳහා ලකුණු 02 යි)

(ii) ⋆ අධිකාරි බලය පදනම් කර ගෙන රාජ්‍ය විසින් ම පනවන්නක් වීම.
⋆ මිනිස් ක්‍රියාකාරකම් හා චර්යාවන් පාලනය කිරීමේ අරමුණින් පනවන්නක් විම.
⋆ යුක්ති සහගත හා සාධාරණ විය යුතු වීම.
⋆ පොදු සමාජ යහපත අරමුණු කොට ගෙන පැන විය යුතු වීම.
(ගුණාංග තුනක් දැක්වීමට ලකුණු 03 යි)

(iii) (a) ⋆ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය.
⋆ අපරාධ නීතිය.
⋆ සිවිල් නීතිය.
( ලකුණු 03)

(b) ⋆ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය උදා: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.
⋆ අපරාධ නීතිය - සමාජයක පුද්ගලයකු හෝ යම් කණ්ඩායමක් විසින් එම සමාජයට විරුද්ධව කරනු ලබන වැරදි සම්බන්ධයෙන් බලපාන නීති උදා: මිනීමැරුම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, සොරකම්, මත්ද්‍රව්‍ය විකිණීම, ළමා අපචාර

★ සිවිල් නීතිය - සමාජයක පුද්ගලයන්ගේ පුද්ගලික සම්බන්ධතා පාලනය කරන සහ ඔවුන් අතර ඇති වැරදි සම්බන්ධයෙන් බලපාන නීතිය උදා - ගිවිසුම්, විවාහ සම්බන්ධ ගැටලු, උරුමයන්, අයිතිවාසිකම්, බැංකු ව්‍යාපාර, වාණිජ කටයුතු සම්බන්ධ ගැටලු, ඉඩම් සම්බන්ධ ගැටලු (ලකුණු 02)

(06) (i) ★ අජෛවී සංරචක ★ ජෛව සංරචක ★ සමාජ පරිසරය ★ ස්වභාවික පරිසරය

(සංරචක දෙකක් දැක්වීමට ලකුණු 02 යි)

(ii) ★ කාබන් චක්‍රය ★ ජල චක්‍රය ★ ඛනිජ චක්‍රය ★ ආහාර දාමයන්

(සංසිද්ධීන් තුනක් දැක්වීමට ලකුණු 03 යි)

(iii) (a) ★ ජීව උපකාරක සේවා

★ ආර්ථික උපකාරක සේවා

★ අපද්‍රව්‍ය අවශෝෂණ සේවා (සේවා තුනක් දැක්වීමට ලකුණු 03යි )

(b) ★ ජීව උපකාරක සේවා - සොබා දහමින් ලැබෙන හිරුඑළිය, වාතය ,ජලය ජීවීන්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යම සේවාවන් වේ.

★ ආර්ථික උපකාරක සේවා - මිනිසාගේ පැවැත්මට අවශ්‍ය අමුද්‍රව්‍ය හා ශක්තිය මීට අයත් වේ.මිනිසා විසින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී වැඩිම බලපෑමක් ඇති කර ඇත්තේ මෙම අංශය සඳහා වේ.

★ අපද්‍රව්‍ය අවශෝෂණ සේවා - සත්ත්ව ලෝකයේ විවිධ ක්‍රියාකාරකම් හා මිනිසාගේ ආර්ථික ක්‍රියාකාරකම් මගින් පරිසරයට එකතු වන අපද්‍රව්‍ය පරිසරය මගින් අවශෝෂණය කර ගැනීම මෙමගින් සිදු වේ.

(තෝරා ගත් එක් සේවාවක් විස්තර කිරීමට ලකුණු 02 යි)

(07) (i) ★ රාජ්‍ය උපාය සම්බන්ධතා

★ යුද උපාය සම්බන්ධතා (ආකාර දෙකක් නම් කිරීමට ලකුණු 02 යි)

(ii) ★ තම රාජ්‍යයට තනිව සපුරා ගත නොහැකි යම් දෙයක් වේ නම් ඒවා සපුරා ගැනීම.

★ දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය ක්ෂේත්‍ර ඔස්සේ සබඳතා පුළුල් කර ගත හැකි විම.

★ ප්‍රබල රාජ්‍ය වලින් ඇති කරන බලපෑම් වලින් ආරක්ෂා වීම සඳහා

★ ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වලින් ඇති වන බාධා මග හරවා ගැනීම සඳහා.

(අරමුණු තුනක් දැක්වීමට ලකුණු 03 යි)

(iii) (a) ★ සම්පත් විසංතුලනය හෙවත් පවතින සම්පත්වල වෙනස්කම්.

★ අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම.

★ ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව. (ලකුණු 03 යි)

(b) ★ සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත් වල වෙනස්කම් - ඛනිජ තෙල් මැද පෙරදිග රටවල බහුලව පැවැතියද ලොව අනෙකුත් රටවල නොමැති වීම.

★ අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම - තම රටේ ජනතාව සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා සේවා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම.

★ ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව - වත්මන් ලොව විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති අතර ක්ෂණිකව මෙන්ම පහසුවෙන් ගමන් පහසුව සලසා ගත හැකි වීම කඩිනමින් තොරතුරු හුවමාරු කර ගැනීම ජාත්‍යන්තර සම්බන්දතා වර්ධනයට හේතු වේ.


(ලකුණු 02 යි)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371




































Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

